## 10 වන පරිච්ඡේදය

# ලෝකයේ විවිධ ප්‍රදේශවල ජීවත් වන ආදිවාසී ජනතාව තම පරිසරය සමග සුසංයෝග ව ජීවත් වන ආකාරය

මිනිසාගේ ජීවන රටාව හැඩ ගැස්වීම කෙරෙහි උෂ්ණත්වය, වර්ෂාපතනය, භූ විෂමතාව වැනි භූගෝලීය පරිසරය සෘජුව ම බලපායි. ලෝකයේ විවිධ ප්‍රදේශවල දක්නට ඇති පරිසරයට අනුගත ව ජීවත් වීමේ හැකියාව එම ප්‍රදේශවල ජන්මය ලැබූ මිනිස් කොට්ඨාසවලට හිමි වී තිබේ. මේ අතරින් අද ලෝකයේ විවිධ පාරිසරික ප්‍රදේශවල ජීවත් වන ආදිවාසීන් සුවිශේෂ ස්ථානයක් හිමි කර ගෙන ඇත. මේ ආදිවාසීන් පිළිබඳ ව අධ්‍යයනය කිරීමටත් ඔවුන් පරිසරයට කොතරම් සංවේදී ව ජීවත් වන්නේ ද යන්න විමසා බැලීමටත් නූතන මානව හිතවාදීන් සහ පරිසරවේදීන් උත්සාහ කරන බව පෙනී යයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් ද මේ පිළිබඳ ව සොයා බැලීමට කොමිසමක් පත් කරනු ලැබී ය. එමගින් 1993 වර්ෂය ආදිවාසීන්ගේ වර්ෂය වශයෙන් නම් කර ඇති අතර ආදිවාසීන් වෙනුවෙන් දිනයක් ද ප්‍රකාශයට පත් කර ඇත. දැනට හඳුනා ගෙන ඇති ආදිවාසී ජන කොට්ඨාස කිහිපයක් ඇත. 10.1 සිතියමෙන් දැක්වෙන්නේ ආදිවාසී ජන කොට්ඨාස ජීවත් වන ප්‍රදේශ කිහිපයකි.




**10.1 සිතියම**
**ආදිවාසී ජන කොට්ඨාස ජීවත් වන ප්‍රදේශ**

▸▸ ආදිවාසී ජන කණ්ඩායම් කිහිපයක්

- ♦ ඇස්කිමෝවරු
- ♦ නීග්‍රෝ
- ♦ පිග්මි
- ♦ බෙඩුවින්වරු
- ♦ ටුවරෙග්වරු
- ♦ රතු ඉන්දියන්වරු
- ♦ ඕස්ට්‍රේලියාවේ ඇබොරිජින්වරු
- ♦ නවසීලන්තයේ මඕරිවරු
- ♦ අයිනුවරු

## ඇස්කිමෝවරු

- ජීවත් වන ප්‍රදේශ : ආක්ටික් ප්‍රදේශය හා ග්‍රීන්ලන්තයේ බටහිර වෙරළ තීරය

- භූගෝලීය පරිසරයේ ස්වභාවය

  - මධ්‍ය වාර්ෂික උෂ්ණත්වය $10^0$c ට අඩු ය.
  - ජූලි මාසයේ මධ්‍ය උෂ්ණත්වය $5^0$cක් පමණ වේ.
  - සිසිරයේ දී මාසයකට වැඩි කලක් භූමිය අන්ධකාරයේ පවතී.
  - මාස 8ක් හෝ 9ක් භූමිය හිමෙන් වැසී පවතී.
  - මුහුදු තීරය මිදුණු හිමවලින් යුක්ත ය.

- පරිසරයට අනුවර්තනය වී ඇති ආකාරය

  - අධික ශීතලෙන් ආරක්ෂා වීමට සිනිඳු ලොම්වලින් කළ ඇඳුම් භාවිත කරන අතර නිවාස ද ශීතලට ගැළපෙන අයුරින් තනා ඇත.

  - සිසිරයේ ද, ගල්, දැව හෝ තල්මසුන්ගේ ඇට කටු යොදා ගෙන සම්වලින් හා හිමවලින් වැසූ කූඩාරම්වල ජීවත් වෙති. එහි අභ්‍යන්තරයේ කොටසක් පොළොව යට ඇති අතර දිග පටු මගකින් ඊට ඇතුළු විය යුතු ය. ඉග්ලූ නමින් එම නිවාස හැඳින්වේ. ඉග්ලූ නිවස උණුසුම් කිරීමට ගෙබිම යට පෝරණු ඇත. එස්කිමෝවරුන්ගේ ඉග්ලූ ගෙයක් 10.1 රූපයෙන් දැක්වේ.

  - ගිම්හානයේ දී විශාල ගල් මත ලී අතුරා සකස් කරන ලද කේතුරූපාකාර කූඩාරම්වල ජීවත් වෙති.

  - ශාක වර්ග නොමැති හෙයින් ආහාර සොයා ගන්නේ දඩයමෙන් හා මසුන් ඇල්ලීමෙනි.
    - සීල් නම් මත්ස්‍ය දඩයම ප්‍රමුඛත්වයක් ගනී.
    - දුන්න, හෙල්ල හා ස්ලෙජ් රිය තනා ගැනීමට දැව ලබා ගන්නේ මුහුදින් පාවී එන දැවවලිනි.
    - හිස්වැසුම ද සීල් මසුන්ගේ ඇටකටු හා සම්වලින් තනා ගෙන ඇත.

  - ආහාර සපයා ගැනීමේ දුෂ්කරතාව ඇතත් ඊට ගැළපෙන ආකාරයට ඔවුන්ගේ ආම්පන්න හා ක්‍රමවේද සකස් කර ගෙන ඇත.



**10.1 රූපය**
**ඉග්ලූ ගෙයක්**

> ක්‍රියාකාරකම 1
>
> - ඇස්කිමෝවරුන්ගේ ජීවන රටාව පිළිබඳ තොරතුරු රැස් කර භූගෝලීය සඟරාවට ලිපියක් ලියන්න.

## නිග්‍රෝවරු, පිග්මිවරු

- ජීවත් වන ප්‍රදේශ : අප්‍රිකාවේ සමක වනාන්තර ප්‍රදේශය. (කොංගෝව, සයරේ, බොට්ස්වානා යන රටවල)

- භූගෝලීය පරිසරයේ ස්වභාවය

අප්‍රිකා මහාද්වීපයේ කොංගෝ වනාන්තරය නිග්‍රෝවරුන්ගේ හා පිග්මිවරුන්ගේ ජන්ම භූමිය ලෙස සැලකේ. අවුරුද්ද පුරා පැතිරී ගිය අධික උෂ්ණත්වයත්, වර්ෂාපතනයත් නිසා මෙම ප්‍රදේශය ඝන කැලෑවෙන් යුක්ත ය. විශාල අතු පතර වැල්වලින් එකට බැඳී ඇති නිසා අඳුරු බවකින් යුක්ත ය. යටි රෝපණය අධික ය. වනාන්තරයට පිවිසීම අපහසු ය. මඩ වගුරු සහිත ය. මැසි මදුරුවන්ගෙන් හා නොයෙකුත් කෘමි සතුන්ගෙන් පීඩා ඇති වේ. අලින්, ව්‍යාඝ්‍රයින් සහ දරුණු උරග වර්ගයේ සතුන්ගෙන් ද සමන්විත ය.

- පරිසරයට අනුවර්තනය වී ඇති ආකාරය

  - වනයට පිවිසීම අපහසු නිසා ඉවුරු අසබඩ පැල්පත් තනා ඇත.
  - කෙසෙල්, අල හා මෑ වර්ග ආහාරයට ගනී.
  - සරල වාමි ජීවිතයකි. දැව ආශ්‍රිත ව තැනූ ගෘහ භාණ්ඩ කිපයක් භාවිත කරයි.
  - ගෘහස්ථ ව ඇති කරන බල්ලන්, එළුවන්, හා කුකුළන් ටික දෙනෙක් සිටිති.
  - ගොවිතැන් කටයුතුවලට බාධා සිදු වන නිසා ආහාර සම්පාදනයට ද ගැටලු ඇති වේ.
  - උෂ්ණ තෙත් දේශගුණයෙන් පීඩා විඳිමින් ජීවිකාව ගෙන යයි.



10.2 රූපය
පිග්මිවරුන්ගේ නිවෙස්

## පිග්මිවරු

- පරිසරයට අනුවර්තනය වී ඇති ආකාරය

  - කෘෂිකර්මය හෝ සත්ත්වපාලනය පිළිබඳ එතරම් අවබෝධයක් නොමැත.
  - දඩයම ප්‍රධාන ජීවන මාර්ගය යි.
  - නිතර නිතර පදිංචි ස්ථානය මාරු කරති.
  - තද වර්ෂාව ඇති අවස්ථාවල පාම් කොළවලින් තැනූ පැල්පත්වල ජීවත් වෙති.

## බෙඩුවින්වරු

- ජීවත් වන ප්‍රදේශය : අප්‍රිකාවේ සහරා ප්‍රදේශය

- භූගෝලීය පරිසරයේ ස්වභාවය

අධික උෂ්ණත්වයත්, අධික වාෂ්පීකරණයත් අඩු වර්ෂාවත් නිසා අප්‍රිකා මහාද්වීපයේ සහරා ප්‍රදේශයෙහි ශුෂ්ක කාන්තාර දේශගුණයක් පවතී. විශාල වැලිතලාවන්ගෙන් යුක්ත ය. ශාක වර්ධනය අඩුවෙන් සිදු වේ. කාන්තාර ක්ෂේම භූමි ආශ්‍රිත ව සුළු වශයෙන් ගස් කොළන් වැවෙන අතර ඒ ආසන්නයේ බෙඩුවින් ජන කණ්ඩායම් ජීවත් වෙති.

- **පරිසරයට අනුවර්තනය වී ඇති ආකාරය**

  - ශුෂ්ක භාවයත්, වැලි මිශ්‍ර පරිසරයත් නිසා වගා කටයුතු කිරීම අපහසු ය. ඒ නිසා ආහාර සපයා ගනු ලබන්නේ සතුන්ගෙනි. එළුවන්ගෙන් කිරි හා මස් ද බැටළුවන්ගෙන් මස් හා සම් ද ලබා ගනියි.
  - ඔටුවා ඔවුන්ගේ හිතවතෙකි. බෙඩුවින්වරුන්ගේ කූඩාරම් හා ගෘහ උපකරණ රැගෙන එහා මෙහා යාමට ඔටුවා යොදා ගනී.
  - සංචාරක ජීවිතයකට පුරුදු වී සිටිති.

## ඇබ්‍රොජින්වරු

- ජීවත් වන ප්‍රදේශ : ඕස්ට්‍රේලියාව (රට අභ්‍යන්තර)
- භූගෝලීය පරිසරයේ ස්වභාවය



10.3 රූපය
ඇබොරිජන්වරු

ඕස්ට්‍රේලියාවේ නැගෙනහිර දෙසින් උස් බිම් ද රට බටහිරින් මහා තැනිතලාව ද රටත් බටහිරින් ඕස්ට්‍රේලියානු කාන්තාර ප්‍රදේශ ද ඇත. ඕස්ට්‍රේලියාවේ උතුරු හා බටහිර කොටස් උෂ්ණාධික යි. ඝන වනාන්තර නොමැත. ඇබ්‍රොජින්වරුන්ගේ වාසභූමිය වන්නේ මෙම ප්‍රදේශය යි.

- **පරිසරයට අනුවර්තනය වී ඇති ආකාරය**
  - ඇබ්‍රොජින්වරු කුඩා කණ්ඩායම් ලෙස ජීවත් වේ.
  - ඔවුහු සංචාරක ජීවිතය ප්‍රිය කරති. ස්ථාවර ව කටයුතු කිරීමට තරම් ඇල්මක්, ඕනෑකමක්, ඔවුන් තුළ නැති තරම් ය.
  - ස්ථිර පදිංචියක් නැති නිසා තාවකාලික පැල්පත්වල ජීවත් වෙති. ඒවා ගස්වල අතුවලින්, කොළවලින්, හා තණකොළවලින් සාදා ඇත.
  - ඔවුන් ගත කරන්නේ ඉතාමත් සරල ජීවිතයකි. ඇඳුම් අඳින්නේ ඉතා සුළු වශයෙනි.
  - දඩයම ප්‍රධාන ජීවන මාර්ගය යි. ඊට අදාළ උපකරණ ලෙස හෙල්ල, කෝටු, ආහාර ගෙන යාමට සුදුසු බෑග් වර්ග තනා ගෙන ඇත.
  - කාන්තාවෝ ළමයින් හා වනයේ ඇවිද අල වර්ග, මැසි පිළව්, කුරුලු කූඩුවල සිටින කුරුලු පැටව් ආහාර සඳහා රැස් කරති.

මීට අමතර ව ආදිවාසි ජනකොටස් ව්‍යාප්ත වූ ප්‍රදේශ කිපයක් ම දක්නට ඇත. දකුණු ඇමරිකාවේ ඝන වනාන්තරවලින් හෙබි උස් බිම්වල හුදකලා ප්‍රදේශයන්හි ඇමසන් ඉන්දියන්වරු හා ඉන්කාවරු නැමැති ආදිවාසි ජන කොටස් ජීවත් වෙති. අප්‍රිකානු මහාද්වීපයේ නැගෙනහිර ප්‍රදේශයේ හවුසා, පුලානි, බුෂ්මන්, බන්ටු හා හොටෙන්ටොට් ආදී නම්වලින් හඳුන්වනු ලබන ජන කොට්ඨාස කිපයක් ම ජීවත්වෙති. ඒ හැර මලයාසියාවේ සකායි හා ශ්‍රී ලංකාවේ ආදිවාසීන් ද සඳහන් කළ යුතු ය.

## සියලු ම ආදිවාසීන් සතු පොදු ගතිලක්ෂණ

ලෝකයේ සෑම ප්‍රදේශයක ම ව්‍යාප්ත වී ඇති ආදී වාසීහු සංචාරක දඩයක්කරුවෝ සහ වන ද්‍රව්‍ය රැස්කරන්නෝ ය. දඩයම් කිරීම සඳහා සරල මෙවලම්, දිග රිටි, ලී උල් ආදිය භාවිතයට ගනිති. වාසස්ථාන වශයෙන් ගල් ගුහා හෝ තනා ගත් කුඩා පැල්පත් සෑම ජන කොට්ඨාසයක් ම සතු ව ඇත. යන්තම් විලි වසා ගැනීම හෝ නිරුවත් ව සිටීම ඔවුන්ගේ ප්‍රධාන ගතිලක්ෂණයකි. කුඩා කණ්ඩායම් ලෙස ජීවත්වන මොවුහු සූර්ය දිව්‍යරාජයා, විශාල ගස්, පර්වත ආදී ස්වාභාවික වස්තූන් වන්දනාමාන කරති. සතුරු කණ්ඩායම්වලට පහර දීම වෙනුවට යන්ත්‍ර මන්ත්‍ර ආදී ගුරුකම්වලට ඇබ්බැහි වී ඇත.

## අභියෝග

1. ආදිවාසීන්ගේ වාසභූමි සඳහා තිබූ වනාන්තර වර්තමානයේ දී විවිධ සංවර්ධන කාර්යයන්ට යොදා ගැනීම නිසා ඔවුන්ගේ බල ප්‍රදේශ සීමා වී ඇත. නිදසුන් වශයෙන් ඇමසන් ද්‍රෝණිය හරහා අධිවේග මාර්ග ඉදි කිරීම නිසා ඔවුන්ගේ වාසස්ථාන අහිමි වීම. ශ්‍රී ලංකාවේ වැද්දන්ගේ හා ඕස්ට්‍රේලියාවේ ඇබ්‍රොජින්වරුන්ගේ බිම් සීමා වීම.
2. භූමි ප්‍රදේශය සීමා වීම නිසා ඇති වන මානසික පීඩාවන් සහ එමගින් ඔවුන්ගේ සාම්ප්‍රදායික සංස්කෘතික වටිනාකම් ආරක්ෂා කර ගැනීමට ඇති වන බාධා
3. ලෝකයේ නවීන ආර්ථික රටාවන් හා ශීඝ්‍රයෙන් සිදු වන නාගරීකරණයත් හේතු කොට ගෙන ඒවායේ බලපෑම්වලට ක්‍රමයෙන් ගොදුරු වීමට සිදු වීම නිසා සම්ප්‍රදායික ජීවන රටාවන් බිඳ වැටීමට පටන් ගැනීම
4. ආදිවාසී සමාජවල වැඩිහිටියන් හා තරුණ පරම්පරාව අතර සිතුම් පැතුම් හා අදහස්වල පරතරයක් තිබීම.
5. වෙනත් ජන කොට්ඨාස සමග විවාහ සම්බන්ධතා ඇති කර ගැනීම නිසා මිශ්‍ර ජාතියක් බවට පත් වීම.
6. ගෝත්‍ර අතර සටන් ඇති වීම.

ක්‍රියාකාරකම 2

- ❖ ලෝකයේ ආදිවාසීන් පිළිබඳ පහත සඳහන් තොරතුරු යටතේ හැකුළුම් පතක් පිළියෙල කරන්න. ආදිවාසීන් ජීවත් වන ප්‍රදේශ, නිවාස/පැල්පත්, ආහාර පාන, ජීවන රටාව, ඇදහිලි හා විශ්වාස, මුහුණ දෙන අභියෝග
- ❖ ලෝකයේ ආදිවාසීන් පිළිබඳ පින්තූර එකතුවක් පිළියෙල කරන්න.
- ❖ ආදිවාසීන්ට එල්ල වන අභියෝග මොනවා ද?